# සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය කෙරෙහි සාම්ප්‍රදායික ජපන් නාට්‍ය කලාවේ බලපෑම

*ගිහාන් මධුසංඛ, එච්. ඒ.* [1]

සිංහල ගැමි නාටකය නම් පර්යේෂණ කෘතියෙහි මහාචාර්ය සරච්චන්ද්‍ර සඳහන් කරන ආකාරයට ලොව ඕනෑම ජන සමාජයක නාට්‍ය කලාවක මූලබීජ මතු කෙරෙන්නේ එරට ක්‍රියාත්මක වන ආගමික අභිචාර ආශ්‍රයෙනි. ලංකාවේ සුවිශේෂ අනන්‍යතාවක් සහිත නාට්‍ය කලාවක් ප්‍රභවය වීමට බුදුසමය පිටුබලයක් නොවූ බව ප්‍රකටය. එහෙත් ජපානයෙහි මේ තත්ත්වය මීට ඉඳුරාම වෙනස්ය. එහි කලාවක් වශයෙන් ගොඩනැගුණු නාට්‍ය කෙරෙහි බෞද්ධ සංස්කෘතියේ හා බෞද්ධ දර්ශනයේ බලපෑම නොඅඩුව ලැබුණි. එදිරිවීර සරච්චන්ද්‍ර සඳහන් කරන ආකාරයට ලෝකයේ බෞද්ධාගමික බලපෑමක් සහිත එකම නාට්‍ය කලාවද එයයි. දේශීය නාට්‍ය කලාවට ජපන් සාම්ප්‍රදායික නාට්‍ය ක්ෂේත්‍රයෙන් ලැබුණු මුල් ආලෝක ධාරා දිස් වන්නේ සරච්චන්ද්‍රගේ නාට්‍ය ආශ්‍රයෙනි. පසුව ඔහුගේ ශිෂ්‍යයකු වූ, දයානන්ද ගුණවර්ධනගේ ඇතැම් නාට්‍ය ඇසුරින්ද මේ ලක්ෂණ විද්‍යමාන වේ.

මෙම අධ්‍යයනයේදී සිදුවන්නේ, සරච්චන්ද්‍රගේ නාට්‍ය උදෙසා බුදුසමයෙන් ආභාසය ලත් සාම්ප්‍රදායික ජපන් නාට්‍ය සම්ප්‍රදායන්ගෙන් අනුබල සැපයුණු ආකාරය විමසීමයි. ජපන් නෝ නාට්‍ය කලාවේ සමාරම්භය ක්‍රි. ව. 14වැනි සියවස දක්වා ඈතට දිවෙන්නකි. සුවිශේෂත්වය නම් අදත් ජපානයෙහි මෙම නාට්‍ය කලාව ජීවමානව පැවතීමයි. ජපානයෙහි නෝ නාට්‍ය කලාව සංවර්ධනය කළ නාට්‍ය රචකයකු හා නළුවකු වශයෙන් ප්‍රකට වූ තැනැත්තා ශෙඅමි මොතොකියෝය. ශෙන් බුදු සමය හා අමිද බුදු දහම නෝ නාට්‍ය කලාව කෙරෙහි දැඩිව බලපා ඇති බවක් පෙනෙයි. ශෙන් බුදු සමයේදී අභිධර්මය වැනි ගැඹුරු දේශනා සරල ප්‍රායෝගික පියවර ඔස්සේ ඉදිරිපත් වෙයි. බොහෝ විට ඒවා ගූඪ ස්වරූපයේ සෞන්දර්යාත්මක චින්තනය සමගද බැඳී පවතින බව පෙනෙයි. නාට්‍යය වනාහි භාවාත්මක සංකල්ප සුඛනම්‍ය ශෛලියකින් වේදිකාගත කරන කලා මාධ්‍යයකි. මේ දෙකෙහි කිසියම් සමීපත්වයක් පවතින බව අන්තර්ඥාන පථයට හසු වෙයි. සරච්චන්ද්‍ර ස්වකීය නාට්‍යවේදය සඳහා පෘථුල ලෙස ආභාසය ලබන්නේ ජපන් '**නෝ**' හා '**කබුකි**' නාට්‍ය ආශ්‍රයෙනි. කබුකි වේදිකාවේ ප්‍රමුඛ අංගයක්වූ '**හනමිචි**' හෙවත් '**මල්මග**' දේශීය වේදිකාවට එක් කර ගැනීමට විටෙක සරච්චන්ද්‍ර

පෙලඹුණේය. විශේෂයෙන්ම මනමේ වැනි නාට්‍යයක සාම්ප්‍රදායික ජපන් නාට්‍යයෙන් ලත් ආභාසය පැහැදිලිවම දක්නට ලැබෙයි. මේ ආභාසයෙන් ලත් අනුප්‍රාණයෙන් යුතුව කතාවස්තුව, රංග ශෛලිය, වේදිකා ආකෘතිය, ජීවන දෘෂ්ටිය, භාෂා ව්‍යවහාරයේ පවත්නා කාව්‍යමය ස්වරූපය වැනි විවිධ පැතිකඩ සඳහා ජපන් නාට්‍ය කලාව ස්වයං අධ්‍යයන ආශ්‍රයෙන් ගොඩනගා ගත් එළැඹීමක් සහිතව පරිභාවිත කිරීමට සරච්චන්ද්‍ර යොමු වූ බව පැහැදිලි වෙයි.

**ප්‍රමුඛ පද :** ආගමික අභිචාර, නෝ නාට්‍ය කලාව, කබුකි නාට්‍ය කලාව, මනමේ

[1] *සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. gihansinhala@gmail.com*